සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
புத்த சாசனம், சமய மற்றும் கலாச்சார அலுவல்கள், தேசிய ஒருமைப்பாடு,சமூக பாதுகாப்பு மற்றும் ஊடகத்துறை அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs , National Integration , Social Security and Mass Media

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல: DSD/HO/05/MF/08/1/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: .................... | දිනය / திகதி / Date: 2024.10.29 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16( නව) ට හයවන එකතුව**

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපති වරුන්,
සමෘද්ධි බැංකු/ බැංකු සමිති කළමණාකරුවන්,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන් සහ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල පොදු උපදෙස් ඇතුලත් මෙහෙයුම් උපදෙස් මාලාව</u>**

01.සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 ( නව) හා ඊට එකතුවන්හි සඳහන් චක්‍රලේඛ උපදෙස් මත , ක්‍රියාත්මක පහත ණය යෝජනා ක්‍රම වලට අදාලව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම මෙම නව එකතුව මගින් සිදුකරන බව දන්වමි.

**02.සමෘද්ධි ලක් වාසනා හා ලක්ජය ණය වැඩසටහන් යටතේ පළමු ණය මුදල් සීමාව ඉහල නැංවීම හා ඊට අදාල වෙනත් උපදෙස්**

I. සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 ( නව) ට දෙවන එකතුවෙහි ඡේද අංක 2: 3 හි 1 හා II සංශෝධනය කරන අතර , පළමු ණය මුදලක් ඉල්ලුම් කරන සාමාජිකයෙකුට වුව ද උපරිම රු.1,000,000 දක්වා ණය මුදලක් ලබාදීමට හැක. මෙහිදී, සමෘද්ධි බැංකු ණය මුදලක් ලබගෙන තිබීම අවශ්‍ය නොවේ.

II. රු.500,000 ට වැඩි ණය මුදලක් සඳහා දේපළ සුරකුමක් ලබාගැනීම අනිවාර්යෙන් වේ. දේපල සුරකුම ලබාගැනීමේදී , සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 ( නව) හි ඡේද අංක 6.4 සිට 6.7 දක්වා හා ඡේද අංක 7.8 හි උපදෙස් අනුගමනය කල යුතුය.

III. ණය තොරතුරු කාර්යාංශයේ CRIB වාර්තාව ලබාගෙන ඔහු /ඇය හෝ ණය මුදල් ලබාගෙන පැහැර හැර නොමැති බවට සනාථ කරගත යුතුය.

IV. දී ඇති උපදෙස් මත , බැංකු සමිතියට ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර ශක්‍යතාවය ලබාගෙන හා විධායක කමිටු එකඟතාවය ලබාගැනීම අනිවාර්ය වේ.

**03. සමෘද්ධි බැංකුවකින් සාමාජිකයින්ට ලබාදෙන පාරිභෝගික ණය සීමාව ඉහල නැංවීම.**

3.1.සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 (නව) හි ඡේද අංක 5.1 හි සඳහන් පාරිභෝගික ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන උපරිම ණය මුදල රු.50,000 දක්වා ඉහල නංවන බව දන්වමි.

3.2.යම් බැංකු සමාජිකයකුට රු. 40,000 හෝ ඊට වැඩි ණය මුදලක් ලබාගැනීමට නම්, සමෘද්ධි බැංකුවෙන් රු.100,000 හෝ ඊට වැඩි ආදායම් උත්පාදන ණය මුදල් 01 ක් හෝ ඊට වැඩි ණය සංඛ්‍යාවක් ලබාගෙන ගිවිසුම් ගත වු පරිදි ගෙවා යන/ ගෙවා අවසන් වී තිබීම.

3.3 රු.40,000 හෝ ඊට වැඩි ණය මුදල් සඳහා කණ්ඩායම් ඇපය සුරකුම ලෙස ලබාගැනීම ද අනිවාර්ය වේ. වෙනත් ඇප නොගතයුතුයි.

3.4 රු.40,000 ට අඩු ණය මුදල් ලබාදීමේ දී ,කණ්ඩායම් හෝ වෙනත් ඇප අවශ්‍ය නොවේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramull

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

3.5. රු.25000 හෝ ඊට වැඩි පාරිභෝගික ණය මුදලක් ආපසු ගෙවීමට උපරිම මාස 36 ක කාලයක් ලබාදෙන අතර,ඊට අඩු ණය මුදලක් සඳහා මාස 24ක් ලබාදියයුතුය.

**04. ලිය සවිය ණය යෝජනා ක්‍රමයේ පුද්ගල ඇප සුරැකුම් සංශෝධනය කිරීම.**

4.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16( නව) ට හතරවන එකතුවේ ඡේද අංක 06 හි රාජ්‍ය සේවක පුද්ගල ඇප මත ණය මුදල් නිකුත් කිරීමේ දී , රාජ්‍ය සේවක පුද්ගල ඇප එකක් (01) මත ණය නිකුත් කිරීමට බලය ලබාදෙමි.

4.2.යම් අවස්ථාවක , මාසික ණය වාරිකය හා පොළී මුදල එක් ඇපකරුවකුගේ මාසික වැටුපෙන් අවකරණය කරගැනීමට නොහැකි අවස්ථාවකදී , උපරිම ඇපකරුවන් 02 ගේ සුරැකුම ලබාගත හැක.

05. ජීවනෝපාය හා කෘෂිකර්ම ණය වැඩසටහන් ණය වැඩසටහන් ඇතුළු අනිකුත් ණය වැඩසටහන් යටතේ රු.100,000 හෝ ඊට අඩු ණය මුදල් පාලක මංඩල ආවර්ණ අනුමැතියට යටත්ව කළමනාකරුට ලබාදිමට බලය මෙමගින් ලබා දෙනු ලැබේ.

06.යම් ණය යෝජනා ක්‍රමයක් යටතේ රු.500,000 හෝ ඊට වැඩි ණය මුදල් නිකුත් කිරිමේදි. සමෘද්ධි ප්‍රජාමූල චක්‍රලේඛ අංක 2021/16 (නව) හි ඡේද අංක 9.3.6 අනුව ණය ව්‍යාපෘතියට/ණය ලබාදෙන කාරණාවට අනුමැතිය ලබාගත යුතුය. නමුත් ණයකරු හා ණය මුදලට අනුමැතිය ලබාදීම බැංකු පාලක මංඩලය සතු බලයක් වේ.

07. මෙම චක්‍රලේඛණය මගින් කරන සංශෝධන මෙපමණ වන අතර, අනිකුත් උපදෙස් සඳහා මුල් චක්‍රලේඛය හා ඊට අදාල එකතුන් වලංගු කර ගත යුතු වේ.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

1 ලේකම්- බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ස.